**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 1 කොටස පිළිබඳ ව්‍යාපෘතිය - 2023**

---------------------------------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ - 1 කොටස පිළිබඳ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2015 සැප්තැම්බර් 17 දින එළඹි අංක 3267- එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 4.06 (අ) වගන්තිය සහ අංක 3268 - එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුමේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

වැඩසටහන් ප්‍රදේශයේ කෘෂිකාර්මික, පානීය හා වාණිජ කටයුතු සඳහා ජල සම්පත් සඳහා ආරක්ෂිත ප්‍රවේශය වැඩසටහනේ අරමුණු වේ. උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය, වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය, මිනිපේ වම් ඉවුර ඇළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන සංරචක තුනක් යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 26,720.80 ට සමාන වූ එ.ජ.ඩො මිලියන 190 ක් වන අතර ඉන් රු. මිලියන 21,095.37 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 150 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 5,625.43 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

වැඩසටහනේ කටයුතු 2015 ජූනි 24 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කරන දිනය 2025 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2023 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධන ප්‍රතිශතය ඒකක/ ප්‍රතිශතය | ලඟාකරගත් කාර්යසාධන ප්‍රතිශතය ඒකක / ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| මහකිතුල පිවිසුම් උමං මාර්ගය ඉදිකිරීම | 100 | 2.97 | මෙම කොන්ත්‍රාත්තුව 2020 – 2024 කාලය තුළ රු. මිලියන 9,978.48 ක වටිනාකමකට ඉදිකිරීම භාරගත් සමාගමට ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් සහ ඉදිකිරීම් උපකරණ නොමැති වීම, දුර්වල වැඩබිම් කළමණාකරණය මත සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රගතිය පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2023 මැයි 26 අවලංගු කර තිබුණි. | එකඟ වේ. | නව කොන්ත්‍රාත්කරුවෙකු පත් කර ඉතිරි ඉදිකිරීම් කඩිනමින් අවසන් කළ යුතුයි. |
| වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය යටතේ මහකිතුල සහ මහකිරුළ ජලාශ 2ක් ඉදිකිරීම සහ එම ජලාශ දෙක අතර කිලෝමීටර් 3.66 ක පෝෂක ඇළ ඉදිකිරීම. | 100 | 1.5 | i) මහකිතුල හා මහකිරුල ජලාශ ඉදිකිරීම සහ ඒ අතර පිහිටි මහදඹේ ජලාශය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අක්කර 778 ක කැලෑ ප්‍රදේශයක පිහිටි ගස් 47,552 ක් දැව සංස්ථාව විසින් කපා ඉවත් කර තිබුණි. කොන්ත්‍රාත්තුව අවලංගු කරන අවස්ථාව වනවිට මහකිතුල ජලාශයේ වැව් බැම්ම සකස් කිරීම සඳහා අත්තිවාරම් කපා මැටි දමා අදාළ වැව් බැම්මේ සියයට 1.5 ක වැඩ නිමකර තිබූ අතර ඒ සඳහා රු. මිලියන 58.2 ක | එකඟ වේ | නව කොන්ත්‍රාත්කරුවෙකු පත් කර ඉතිරි ඉදිකිරීම් ආරම්භ කිරීම සහ කොන්ත්‍රාත්තුවේ සිදු කරන ලද කාර්යයේ වටිනාකමට වඩා උපදේශන ගාස්තු ගෙවීම විමර්ශනය කිරීම කල යුතු වේ. |

| | | |
|---|---|---|
| වියදමක් දරා තිබුණි. එම රු. මිලියන 58.2 ක ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන සමාගම වෙත කාර්ය මණ්ඩල වැටුප්, කාර්යාල වියදම් හා වාහන නඩත්තුව සඳහා රු. මිලියන 139 ක් වැයකර තිබුණි. | | |
| (ii) කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට සැලසුම් සකස් කර නොතිබුණු අතර මහකිතුල පිවිසුම් උමඟ හා අනුබද්ධ ඇළ මාර්ගය පමණක් රු. මිලියන 2,742 ක දේශීය අරමුදල් යොදවා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ 2024 – 2027 කාලය තුළ නිම කිරීමටත්, ඒ සඳහා 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. මිලියන 1,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | ADB මූල්‍යනය හෝ වෙනත් විකල්ප මූල්‍යනයක් නොමැතිකම හේතුවෙන් ඉතිරි වැඩ නැවත ප්‍රදානය කිරීම දැනට කළ නොහැකි වේ. | ව්‍යාපෘතිය නිම කිරීම සඳහා මුදල් ලබා ගැනීම සැලසුම් සහගත විය යුතුය. |

**2.2** ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීම ප්‍රමාද වීම

| | විගණන නිරීක්ෂණය | සම්පූර්ණ කිරීමට නියමිත දිනය | සම්පූර්ණ කරන දිනය | ප්‍රමාද වසර | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | වයඹ ඇළේ නැබඩගහවත්ත සිට මහකිතුල ජලාශයේ ඇතුල්වන උමං මාර්ගය දක්වා කිලෝමීටර් 17+050 ඇළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව. ලද වන්දි මුදල ඉඩම් කට්ටි 06ක් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඉඩම් හිමිකරුවන් 03 දෙනෙකු වන්දි සමාලෝචන මණ්ඩලය වෙත එය යොමු කර තිබීම හේතුවෙන් ඇළේ මීටර් 355ක් සෑදීමට නොහැකිව කොන්ත්‍රාත්තුව දීර්ඝ කාලයක් ප්‍රමාද වී තිබුණි. | 2018– 2021 | කාලය 2023 දෙසැම්බර් 05 දක්වා දීර්ඝ කර ඇත. | 02½ years | ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කර ඉදිකිරීම් කටයුතු කරගෙන ගොස් තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම් සහ වන්දි ගෙවීම් නියමිත කාලය තුළ අවසන් කළ යුතුය. |
| (ආ) | මෙම ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 7,226.62 (වැට් බදු ඇතුළුව) සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව රු.මිලියන 15,154.74 දක්වා රු.මිලියන 7,928.12 කින් සියයට 110කින් ඉහළ ගොස් තිබුණි. 2022 වසරේ සිට ආර්ථික හා මූල්‍ය අවපාතය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම හේතු කොට ගෙන රු.මිලියන 162 ක අනුමත මිල විචලනය රු.මිලියන 5,827.7 දක්වා ඉහළ ගොස් තිබුණි. | 2018 – 2021 | කාලය 2023 දෙසැම්බර් 05 දක්වා දීර්ඝ කර ඇත | 02½ | එකඟ වේ.<br>මිල ගැලපුම් සහ CIDA මිල දර්ශක සඳහා FIDIC සූත්‍රය භාවිතා කර කොන්ත්‍රාත් කොන්දේසි අනුව මිල උච්චාවචනය ගෙවිය යුතු වේ. | නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් කාලය 2023 දෙසැම්බර් 05 දක්වා පමණක් දීර්ඝ කර තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබූ අතර එදිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 91.4ක් විය. | 2018 – 2021 | කාලය 2023 දෙසැම්බර් 05 දක්වා දීර්ඝ කර ඇත | වසර 02½ | එකඟ වේ.<br><br>කොන්ත්‍රාත්කරු 2024 සැප්තැම්බර් සිට 2024 දෙසැම්බර් දක්වා අයහපත් කාලගුණික තත්ත්වයෙන් පීඩා විඳි අතර 2024 මැයි 17 දක්වා කාලය දීර්ඝ කිරීම සඳහා හිමිකම් ලබා ඇත. | කොන්ත්‍රාත්තුව ඉක්මනින් අවසන් කිරීමට පියවර ගත යුතුයි. |

## 2.3 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කරන ලද ව්‍යාපෘතියේ තාක්ෂණික සහකාර පසුව එම වැඩසටහනේ උපදේශන සමාගමේ සේවයට එක් වූ අතර වසර 07ක කාලයක් කණ්ඩායම් නායකයා සහ ප්‍රධාන සැලසුම් ඉංජිනේරුවරයා ලෙස සේවය කර තිබුණි. ඒ සඳහා ඔහුට යුරෝ 26,000 (රු. මිලියන 8.5) ක මාසික වැටුපක් ගෙවමින් සිටි අතර, 2023 ජුනි මාසය වන විට ඔහුට වැටුප් වශයෙන් රු.මිලියන 702.18 ක් ගෙවා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩසටහන සකස් කිරීමේ කාර්යයට සහය වූ අයෙකු එම වැඩසටහනේ උපදේශන ආයතනයේ යෙදවීම තුළින් වැඩසටහන් අධීක්ෂණයේ ස්වාධීනත්වය අභියෝගයට ලක් කර තිබුණි. 2013 වසරේ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ලද “ආසියානු සංවර්ධන බැංකුව සහ එහි ණය ගැතියන් විසින් උපදේශකයින් භාවිතා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ” හි 1.11 ඡේදය ප්‍රකාරව මෙම උපදේශකයාගේ සේවය ලබා ගැනීම ද පටහැනි වී තිබුණි. | උපදේශක ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සිදු කර ඇත.එබැවින්, ප්‍රසම්පාදනය ආසියානු සංවර්ධන බැංකුව මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය.උපදේශක කණ්ඩායම සඳහා ගෙවීම් උපදේශන ගිවිසුමට අනුකූලව ගෙවනු ලැබේ. | වැඩසටහන් අධීක්ෂණය ස්වාධීන විය යුතු අතර බඳවා ගැනීම් ADB මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | යෝජිත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ විෂය පථය, ප්‍රතිදානය සහ සේවාවල කාල ප්‍රමාණය තීරණය කළ හැකි බැවින්, කොන්ත්‍රාත්තුවේ කාර්ය සාධනය මත පදනම්ව උපදේශක ගාස්තු ගෙවිය යුතු වුවද, 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයක් සඳහා ඇ.ඩො. මිලියන 22.09 ක් වටිනා උපදේශන කොන්ත්‍රාත්තු ගිවිසුමක් කාල පදනම මත ගෙවීම සඳහා වැඩසටහනේ උපදේශකයා සමඟ අත්සන් කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීම නිසා උපදේශක කොන්ත්‍රාත් ගිවිසුම 2024 ජුනි 30 දක්වා අවස්ථා 06කදී දීර්ඝ කර ඇති අතර, මෙම දීර්ඝ කළ කාල සීමාව මත උපදේශන ගාස්තු ගෙවීමට සිදුවීමෙන් වියදම ඇ.ඩො. මිලියන 41.56ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශන ගාස්තු අදියර 1 සහ 2 සඳහා උපදේශන ගාස්තු ගෙවීමට ඇ.ඩො. මිලියන 25.93ක් පමණක් වෙන්කර තිබූ බැවින්, ඉක්මවූ උපදේශන ගාස්තු අනෙකුත් වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් ගෙවීමට සිදු වී තිබුණි. | මෙම උපදේශන ගිවිසුමේ අඩංගු වන්නේ,<br>• කාර්යය මත යැපෙන එකවර ගෙවීම්<br>• කාලය මත පදනම් වූ ගෙවීම්<br>උපදේශකයාගෙන් අවශ්‍ය සේවාවන්හි ස්වභාවය අනුව.<br>කාලය මත පදනම් වූ සේවාවන් පැහැදිලිවම ඉදිකිරීම් සම්බන්ධතා වල "සම්පූර්ණ කිරීමේ කාලය" වෙත සංවේදී වන බැවින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු අවසන් වන තෙක් දීර්ඝ කිරීමට සිදු විය. උපදේශන සේවා සඳහා මුල්ම වෙන්කිරීම එජඩො මිලියන 22.09 ක් වූයේ අදියර 1 සහ මාස 60 ක කාලය සඳහා පමණි. අදියර 2 කාර්යයන් සඳහා සංශෝධන සහ වෙනස්කම් කිහිපයක් අනුමත කරන ලද අතර විෂය පථය වෙනස් කරන අයිතම සහ ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ සමහර වෙනස්කම් වේ. | ගිවිසුම මත පදනම්ව උපදේශන ගාස්තු ගෙවීම සහ කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කර වෙනත් ඉදිකිරීම් සඳහා වෙන් කළ මුදල් යොදවා උපදේශන ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු ව්‍යාපෘතියේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතිය ආරම්භයේදී උපදේශන කටයුතු සඳහා විදේශිකයන් 34 දෙනෙකු බඳවාගෙන ඇති අතර දැනට විදේශිකයන් 8 දෙනෙකු සේවයේ යෙදී තිබුණි. විදේශිකයෙකුට මසකට යුරෝ 16,000 සිට 26,000 දක්වා (රු.මිලියන 5.5 සිට රු.මිලියන 9 දක්වා) වැටුපක් සහ යැපුම් දීමනා දිනකට යුරෝ 70 සිට 110 දක්වා ගෙවා තිබුණි. 2023 ජූනි 30 වන විට මෙම විදේශිකයන්ට යුරෝ 12,843,998 (රු. මිලියන 4, 341) වැටුප් සහ යැපුම් දීමනා යුරෝ 1,068,599 (රු. මිලියන 361.18) ගෙවා තිබුණි. | උපදේශන සේවා සඳහා ගෙවීම් උපදේශන ගිවිසුමට අනුකූලව ගෙවනු ලැබේ. | (i) යම් ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කරමින් මාසික වැටුප් ලබන පුද්ගලයින්ට යැපුම් දීමනා නොගෙවීමට පියවර ගත යුතුය.<br>(ii) ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමටත් උපදේශන වියදම් අඩු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | විදේශීය උපදේශන සමාගම විසින් අනුබද්ධ දේශීය සමාගම් 02ක් හරහා දේශීය සේවකයන් 161 දෙනෙකු බඳවාගෙන තිබූ අතර ඉන් 110 දෙනෙකු මේ වන විට සේවය කරමින් සිට තිබුණි. මෙම කාර්ය මණ්ඩලයට අමතරව කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සේවය කරන 48 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සහ කොන්ත්‍රාත් ප්‍රදේශයන්හි පිහිටි වැඩබිම් කාර්යාලවල සේවය කරන 08 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සඳහා කාලය මත පදනම්ව උපදේශන ගාස්තු ගෙවා තිබුණි. | එකඟ වී නැත.<br>2023 ජූනි වන විට,<br>• කොළඹ කාර්යාලය - කාර්ය මණ්ඩල සාමාජිකයින් 34 ක්<br>• වැඩබිම් - කාර්ය මණ්ඩල සාමාජිකයින් 117 දෙනෙකුට කාලය මත පදනම්ව ගෙවන ලදී. | (i) උපදේශන පිරිවැය අවම වන ක්‍රමවේදයක් මුල සිටම සකස් නොකිරීමට අදාළ බලධාරීන් වගකිව යුතු බැවින් ඔවුන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.<br>(ii) ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමටත් උපදේශන වියදම් අඩු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | Guidelines on The Use of Consultants by Asian Development Bank and its Borrowers March 2013 (ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කළ බැංකුව සහ එහි ණයගන්නන් විසින් උපදේශකවරුන් යොදවා ගැනීමේ මඟ පෙන්වීම් අත්පොතෙහි) 1.11 (b) සහ (c) ඡේද අනුව උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගන්නා සමාගම හෝ සමාගම් අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත් (උදා:- නිර්මාණ සැලසුම් සකස් කිරීම, පාරිසරික ඇගයීම්) කලින් සිදුකර තිබේනම් උපදේශන කටයුතු සඳහා එම සමාගම් නැවත පත්කර නොගත යුතු අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ණය ගන්නා (වාරිමාර්ග අමාත්‍යාංශය) ආයතනවල සේවකයින් සමඟ පවුල් හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන්ද උපදේශන කටයුතු සඳහා දායක කර නොගත යුතු වේ.කෙසේ වෙතත්, උතුරු මැද සහ වයඹ ඇළ සහ මිනිපේ ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘති 2015 වැඩසටහන සඳහා සැලසුම් නිර්මාණය, පාරිසරික තක්සේරු වාර්තා, ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ නවීකරණ | මෙම පැවරුම් දෙක විවිධ කාල පරිච්ඡේද දෙකක සිදු කර ඇත, එබැවින් අන්‍යෝන්‍ය වශයෙන් බැහැර ඒවා ලෙස සැලකිය හැකිය.<br>• උපදේශකයින් තෝරා ගැනීම අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සිදු කර ඇත. | ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයන්ට පටහැනිව, උපදේශකයින් තෝරා ගැනීමේ මෙම අවිධිමත් ක්‍රම වහාම නතර කර ආසියානු සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තා සකස් කිරීම සඳහා Infotech IDEAS සමාගමට මහවැලි උපදේශක කාර්යාංශය හරහා රු. මිලියන 102.98 ක මුදලක් ලැබී තිබුණි. තවද, මෙම වැඩසටහනේ ප්‍රධාන උපදේශකයා වූ ට්‍රැක්ටබල් (Tractable ) හි ශ්‍රී ලංකා නියෝජිත සමාගම ලෙස කටයුතු කර ඇති අතර, මෙම සමාගමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ණය ගැනුම්කරුගේ වාරිමාර්ග අමාත්‍යාංශය සහ හා ඒ යටතේ ඇති ආයතන වල විශ්‍රාමලත් නිලධාරින්ගෙන් සමන්විත විය. | | |
| (ඊ) | අමානෝ තහඩු යොදා කොන්ත්‍රාත්කරුගේ උපදේශක සමාගමේ සහ උපදේශක සමාගමේ ආපන ශාලාව තාවකාලික කඳවුරු ලෙස ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙළින් රු. මිලියන 41.59, රු. මිලියන 18.32 හා රු. මිලියන 7.4 ක් ගෙවා තිබුණු අතර, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු එම ගොඩනැගිලි ව්‍යාපෘතියට භාර දී තිබුණි. එහෙත්, කොන්ත්‍රාත්කරු භාවිතා කළ කඳවුරේ සවිකර තිබූ සියළුම වායු සමීකරණ යන්ත්‍ර ගලවා ඉවත් කර භාර දී තිබුණි. | කොන්ත්‍රාත්තුවේ වෙන්කිරීම් වලට අනුව ඉවත් කිරීමකදී කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිසංස්කරණයේ කොටසක් ලෙස සවිකෘත සහ සවිකිරීම් සමඟ එවැනි සියලුම තාවකාලික පහසුකම් ඉවත් කළ යුතුය. | පවරාගෙන ඇති තාවකාලික ගොඩනැගිලි ස්වාධීන පාර්ශ්වයක් විසින් තක්සේරු කළ යුතු අතර වැඩිපුර ගෙවා ඇත්නම් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතුය. |

## 2.4 ව්‍යාපෘති අරමුණුවලින් බාහිර ක්‍රියාකාරකම්/ ගෙවීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මෙම කොන්ත්‍රාත්තුව යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දේවහුව ඉංජිනේරු කාර්යාලය අලුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම සඳහා රු.මිලියන 10 ක මුදලක් වෙන් කර තිබූ අතර එය ඉටු නොකර ව්‍යාපෘතියේ උපදේශක සමාගම සඳහා රු.මිලියන 9.6ක් වැය කර දෙමහල් නිවසක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. | කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ මූලික අදියරේදී දේවහුව වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පරීක්ෂාවට ලක් කළ අතර එය ප්‍රතිසංස්කරණය කළ හැකි තත්ත්වයේ නොතිබූ බැවින්, ඉතා කෙටි කාලයක් තුළ තෝරාගත් විකල්පය වූයේ ව්‍යාපෘතිය සඳහා වඩාත්ම මධ්‍යගතව පිහිටි ගොඩනැගිල්ල කුලියට ගෙන නේවාසික ඉංජිනේරු කාර්යාලය පිහිටුවීමයි. | සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් සිදු කිරීමට පියවර ගත යුතුය. |

## 2.5 මතභේදාත්මක ගනුදෙනු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිනිපේ අමුණ උස්කිරීමේ කොන්ත්‍රාත්තුවේ වම් ඉවුර සහ දකුණු ඉවුර ඇළ සඳහා ජල පාලන හා මිනුම් පහසුකම් ඇතුළුව රු.මිලියන 1,864.80 ක (බදු රහිතව) වටිනාකමකට විදේශීය සමාගමකට 2018 ජනවාරි 05 වන දින ප්‍රදානය කර ඇති අතර එය 2020 නොවැම්බර් 12 වැනි දින සම්පූර්ණ කළ යුතුව තිබුණි. එසේ වුවද, විවිධ හේතූන් මත කොන්ත්‍රාත් කාලය 2021 ජූලි 31 දක්වා දින 243කින් දීර්ඝ කර තිබුණි. යෝජිත මිනිපේ අමුණ මධ්‍යයේ රොන් මඩ ඉවත් කරන ගේට්ටුවක් සවි කිරීමට සැලසුම් කර තිබුණද, පසුව ගේට්ටුව ක්‍රියාත්මක කිරීමේදී සහ නඩත්තු කිරීමේදී ප්‍රායෝගික ගැටලු ඇති විය හැකි බව හඳුනා ගැනීමෙන් පසුව ඉවත් කර තිබුණි. එම කටයුතු ඉවත් කිරීමට දින 134ක් ලබාදීම මතභේදකාරී කරුණක් බවට පත්ව තිබුණි. | මෙය ක්‍රියාකාරී සහ මෙහෙයුම් පහසුව සඳහා ටෙන්ඩර් සැලසුමට පසුව කරන ලද වැඩිදියුණු කිරීමේ ප්‍රතිඵලයකි. යෝජිත මධ්‍යම රොන් මඩ ඉජෙක්ටරය ප්‍රතිස්ථාපනය කිරීම ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත තාක්ෂණික සමාලෝචන කමිටුව විසින් සිදු කරන ලද ගැඹුරු අධ්‍යයනයකින් පසුව සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩසටහනේ කාලය දීර්ඝ විය. | සැලසුම් කල ක්‍රියාකාරකම් සිදු කළ යුත්තේ අදාළ සියලු කරුණු සලකා බැලීමෙන් පසුවය. |
| (ආ) | ඉහත කොන්ත්‍රාත්තුව වසර 02 කට ආසන්න කාලයක් දීර්ඝ කිරීමකින් තොරව සිදු කර ඇති අතර, මෙම කාලය තුළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 22 ක් වී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.මිලියන 2,912.85 දක්වා වැඩි කිරීමටත් ඉතිරි වැඩ කටයුතු එම කොන්ත්‍රාත්කරු විසින්ම සිදුකිරීමට අංක 02 දරන සංශෝධිත ගිවිසුම අත්සන් කිරීමටත්, කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් 21 දක්වා දීර්ඝ කිරීමටත් 2023 ජුනි 05 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණද සංශෝධිත ගිවිසුමට කොන්ත්‍රාත් වටිනාකම ඇතුළත් කර නොතිබුණි. ඉහළ ගිය රු.මිලියන 1,048.05ක කොන්ත්‍රාත් වටිනාකම තුළ මිල විචලනය සඳහා රු. මිලියන 996.10 ක් වැනි ඉහළ අගයක් තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ සංශෝධනය කර ඇත්තේ කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල උප වගන්ති කිහිපයක් පමණක් සංශෝධනය කිරීම සඳහා ය. මුල් කොන්ත්‍රාත් ගිවිසුමේ අනෙකුත් සියලුම කොන්දේසි ප්‍රධාන ගිවිසුමට අනුව තවමත් පවතී. මුල් ගිවිසුමේ ලබා දී ඇති පිළිගත් කොන්ත්‍රාත් මුදල යන්නෙන් අදහස් වන්නේ වැඩ ක්‍රියාත්මක කිරීම සහ සම්පූර්ණ කිරීම සහ කිසියම් දෝෂයක් සඳහා පිළියම් යෙදීම සඳහා පිළිගත් ලිපියේ පිළිගන්නා ලද මුදලයි (උප වගන්තිය 1.1.4.1). කෙසේ වෙතත්, කොන්ත්‍රාත් මිල යනු 14.1 උප වගන්තියේ අර්ථ දක්වා ඇති මිල වන අතර එක් එක් සංශෝධනයේදී ලේඛනගත කිරීමට අවශ්‍ය නොවන කොන්ත්‍රාත්තුවට අනුකූලව ගැලපීම් ඇතුළත් වේ. | (i) කොන්ත්‍රාත්තුව ආරම්භයේදී නිසි ලෙස සැලසුම් නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ව්‍යාපෘති නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.<br>(ii) කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රවේශමෙන් සකස් කළ යුතු අතර අත්සන් කිරීමට පෙර අවශ්‍ය සියලු තොරතුරු ඇතුළත් කර ඇති බවට සහතික විය යුතුය.<br>(iii) කඩිනමින් ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය යටතේ මොරගහකන්ද ජලාශයේ සිට කිලෝමීටර් 6.225 ක ඇළ මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 සිට 2020 දක්වා කාලය තුළ රු.මිලියන 3,254.29 ක මුදලකට දේශීය කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. 2021 මැයි 31 වන විටත් ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 64 ක් පමණක් වූ අතර කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය බාධා හේතුවෙන් වැඩ නිම කිරීමට නොහැකි වී තිබුණි. කොන්ත්‍රාත්තුව අඛණ්ඩව කරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් 2021 ජූලි 13 දින අවලංගු කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් බැංකුවේ තබා ඇති අත්තිකාරම් සහ කාර්ය සාධන ඇපකරවලින් අලාභ අයකර ගැනීම වළක්වාලමින් නඩුවක් ගොනු කර තිබූ බැවින්, කොන්ත්‍රාත්කරුගෙන් අය කළ යුතු බලමුලු ගැන්වීමේ අත්තිකාරම් මුදල රු.මිලියන 185.89 ක් සහ කාර්ය සාධන ඇපය රු.මිලියන 390.51 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | කොන්ත්‍රාත්තුව "අවලංගු" නොව "අවසන්" කර ඇත ඊට අදාළ නඩුව නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ප්‍රතිඵලය ලැබෙනතුරු බලා සිටින ලදී. | කොන්ත්‍රාත්තුවේ ඉතිරි ඉදිකිරීම් සහ නිම නොකළ කොටස් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු හරහා කඩිනමින් ඉදිකිරීම් අවසන් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ණය ගිවිසුම් අදියර 03 සඳහා තවමත් අත්සන් කර නොමැති අතර 2019-2023 කාලසීමාව තුළ අවසන් කිරීමට නියමිත වයඹ ඇළ ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්තු 03 මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | එකඟ වේ. ADB මූල්‍යකරණය හෝ වෙනත් විකල්ප මූල්‍යකරණයක් නොමැතිකම හේතුවෙන් ඉතිරි වැඩ නැවත ප්‍රදානය කිරීම දැනට සිදුකළ නොහැක. | වයඹ ඇළ ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් සිදු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් සහ භාණ්ඩාගාරයෙන් නිසි අනුමැතිය ලබා ගැනීම. |

## 2.6 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2016 සිට 2023 දක්වා කාලය සඳහා වෙන් කරන ලද අරමුදල් ඌන උපයෝජනය හේතුවෙන් මෙම වැඩසටහනට 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 117.14 ක මුදලක් බැඳීම් ගාස්තුවක් දැරීමට සිදු වී තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය, ජල ප්‍රශ්න, අයහපත් කාලගුණය, පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 තත්ත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ආර්ථික අර්බුදය වැනි විවිධ හේතු නිසා ව්‍යාපෘති කාර්ය සාධනය මන්දගාමී විය.එබැවින් ණය සැලසුම් කළ පරිදි උපයෝජනය නොකළ අතර, වැඩි බැඳීම් ගාස්තුවක් දැරීමට සිදු විය. | ශක්තිමත් මූල්‍ය පාලනය සහ ක්‍රියාකාරකම් සැලැස්මට අනුව සිදු කළ යුතුය. |